සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## නාට්‍ය හා රංග කලාව

**නම/විභාග අංකය :-- .....................................................................................** **කාලය : පැය 02යි.**

### i කොටස

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

♦ **හරි නම් හරි ලකුණ ද (√) වැරදි නම් වැරදි ලකුණ ද (X) යොදන්න.**

1. ක්ෂණික නිරූපණය පෙර පුහුණුවකින් තොරව ඉදිරිපත් කරයි. ( )
2. චරිත අතර ඇති වන සංවාද රංග විධාන ලෙස හැඳින් වේ. ( )
3. තවත් අයෙකු ලෙස කටයුතු කිරීම හෙවත් ක්‍රියා කිරීම සමාරෝපය ලෙස හැඳින් වේ. ( )
4. හඬ පුහුණුව සඳහා භාවිත කළ හැකි ග්‍රන්ථ ලෙස නම් පොත හා සකස්කඩය නම් කළ හැක. ( )
5. රූපවාහිනිය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් නොවේ. ( )

♦ **ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

6. නාට්‍ය නිර්මාණයේ දී ආනුෂාංගික අංග ලෙස හැඳින්වෙන්නේ,
   i. ප්‍රේක්ෂකයා, අංග රචනය  ii. අංග රචනය, නළුවා
   iii. රංග වස්ත්‍රාභරණ, නාට්‍ය උපකරණ  iv. රංග භාණ්ඩ, පිටපත

7. මුහුණ රතු වේ කඳුළු ගලයි, කට ඇද වේ මෙය කුමන අභිනයට අයත් ද?
   i. වාචික අභිනය  ii. සාත්වික අභිනය
   iii. ආංගික අභිනය  iv. ආහාර්යය අභිනය

8. කතාන්දරයක විශේෂ ලක්ෂණයකි,
   i. වාචික අභිනයෙන් තොරවීම.  ii. බලා රසවිඳීම ප්‍රධාන වීම
   iii. නළුවන් රංගනයේ යෙදීම අනිවාර්ය වීම  iv. මුල මැද අග පිළිවෙලින් ඉදිරිපත් වීම

9. වර්තමානයේ බහුල ව භාවිත වන රංග භූමිය වන්නේ,
   i. කවාකාර රඟමඬල  ii. කමත
   iii. පින්තූර රාමු වේදිකාව  iv. කරලිය

10. පරිකල්පනය හා බැඳි රංග අභ්‍යාසය ලෙස දැකිය හැක්කේ,
    i. වෙද පුටුව  ii. නම් පොත කියවීම
    iii. භාවනාව  iv. ඇවිදීම

♦ **සුදුසු පිළිතුර තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11. | චරිතයක අදහස් ප්‍රකාශනයට යොදාගනී. | දේශාභිමානී ගීත |
| 12. | රූපවාහිනිය | තේමාව |
| 13. | රංගය සඳහා යොදා ගන්නා අනුශාංගික අංග | සංවාද |
| 14. | රට පිළිබඳ ඇල්මක් ඇති කිරීම | නාට්‍ය උපකරණ |
| 15. | නාට්‍යයක මූලික අදහස | විද්‍යුත් ජන මාධ්‍ය |

♦ **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**
(මනස, වාචික, සජීවි, රංග, සිද්ධියක්)

16. නාට්‍ය යනු ................................................ කලාවකි.

17. රූපණ කාර්යයේ දී ශරීරය හා .................................................. ප්‍රයෝජනයට ගනී.

18. නාට්‍ය පිටපතක් ලිවීම සඳහා .................................................. පදනම් කරගනී.

19. නාට්‍යයක ප්‍රබල ම අංගය .................................................. අභිනය ලෙස හැඳින් වේ.

20. රංගයක් සඳහා භාවිත වන ස්ථානය .................................................. භූමිය ලෙස හැඳින් වේ.

(ලකුණු 2 X 20 = 40)

---

## ii කොටස

♦ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 03 ක් ඇතුළුව ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

| | |
|---|---|
| පණ්ඩුකාභය රජු | මද්දුම බණ්ඩාර කුමරා |
| පැරකුම්බා රජු | විහාරමහා දේවිය |
| වාරියපොළ සුමංගල හිමි | මහසෙන් රජු |
| කුවේණි | බුද්ධදාස රජු |
| දුටුගැමුණු රජු | හික්කඩුවේ ශ්‍රී රාහුල හිමි |

**01. ඉහත ඓතිහාසික චරිත ඇතුළත් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1. ‘අහසින් වැටෙන එක දිය බිඳුවක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යා නොදෙමි.’ යන ප්‍රකාශය කළ රජතුමාගේ නම ලියන්න. .......................................................................... (ලකුණු 2)

2. ‘අයියණ්ඩිය බිය නොවන්න මැරෙනා සැටි මම පෙන්වන්නම්’ මෙසේ ප්‍රකාශ කළ කුඩා විරුවා කවුද? ....................................................................... (ලකුණු 2)

3. සතුන්ට කරුණාව දක්වා වෛද්‍ය ප්‍රතිකාර කළ රජතුමා වන්නේ කවරෙක් ද?
....................................................... (ලකුණු 2)

4. ඉහත රජවරු සම්බන්ධ කරගෙන නිර්මාණය කරන ලද චිත්‍රපට දෙකක නම් ලියන්න.
1. ...........................................................................
2. ........................................................................... (ලකුණු 2)

5. රට වෙනුවෙන් මුහුදට බිළි වූ වීර කාන්තාවගේ නම හා විජය කුමරු සරණ පාවාගත් කාන්තාවකගේ නම තෝරා පිළිවෙලින් ලියන්න. (ලකුණු 2)
1. ...........................................................................
2. ...........................................................................

6. අප රටේ ආගමික සේවාව වෙනුවෙන් නිදහස උදෙසා කටයුතු කළ ස්වාමීන් වහන්සේලා දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)
1. ...........................................................................
2. ...........................................................................

7. වීර චරිත පදනම් කොටගෙන නිර්මාණය වූ ගීතයක කොටසක් ලියන්න. (ලකුණු 3)

02. i. ක්ෂණික නිරූපණය යනු කුමක් ද? (ලකුණු 3)
ii. සාමූහික ක්ෂණික නිරූපණයට අදාළ මාතෘකා තුනක් ලියන්න. (ලකුණු 6)
iii. ක්ෂණික නිරූපණ මඟින් ශිල්පීන්ට ලැබෙන පිටුවහල විස්තර කරන්න. (ලකුණු 6)

03. i. ආධුනික රංගන ශිල්පියෙකු තම රංගන කුසලතාව වැඩි දියුණු කර ගැනීමට භාවිත කළ හැකි අභ්‍යාස තුනක් නම් කරන්න. (ලකුණු 3)
ii. කටහඬ අභ්‍යාසවල දී යොදාගත හැකි ක්‍රියාකාරකම් දෙකක් කෙටියෙන් ලියන්න. (ලකුණු 6)
iii. ඔබ හඬ පුහුණුව සඳහා ඉගෙනගත් නාට්‍ය ගීතයක් ලියා දක්වන්න. (ලකුණු 6)

04. i. වේෂ භූෂණ යනු කුමක් ද? (ලකුණු 3)
ii. නාට්‍යයක වේෂ භූෂණ සැකසීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න. (ලකුණු 6)
iii. රාජ කුමරියකට උචිත පැළඳුම් (ආභරණ) ඇඳ වර්ණ ගන්වන්න.

05. i. යහපත් සිරිත් විරිත් අන්තර්ගත ඔබ ඉගෙන ඇති කාව්‍ය ග්‍රන්ථය නම් කරන්න. (ලකුණු 3)
ii. එහි සඳහන් කවියක් ලියා දක්වන්න. (ලකුණු 6)
iii. එම කවියෙන් කියැවෙන අදහස ඔබේ වචනයෙන් විස්තර කර දක්වන්න. (ලකුණු 6)

06. ඔබ ඉගෙනගත් පරිසරය පදනම් කරගත් අත්දැකීම් පරිකල්පනය කරමින් කවි පන්තියක් (කවි 2ක් පමණ) නිර්මාණය කරන්න. (ලකුණු 13)
ඊට සුදුසු මාතෘකාවක් ද යොදන්න. (ලකුණු 2)

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## නාට්‍ය හා රංග කලාව - ප්‍රායෝගික පරීක්ෂණය

---

01. නාට්‍ය ගීතයක් ගායනා කිරීම (ලකුණු 20)

02. සුදුසු පෙළක් ඇසුරෙන් සංවාද ඛණ්ඩයක් කියැවීමට දීම (ලකුණු 20)

03. චරිත නිරූපණයට සුදුසු මාතෘකාවක් ලබා දී ඇගයීමට ලක් කිරීම (ලකුණු 30)

04. සුදුසු මාතෘකාවක් ඔස්සේ කණ්ඩායම් ක්ෂණික නිරූපණයන් සඳහා සිසුන් යොමු කිරීම (ලකුණු 30)